ස.සේ.කො.චක්‍රලේඛ අංක : 2/2003/(I)

මගේ අංකය : ස.සේ.කො./01/iv වෙළුම,
සමුපකාර සේවක කොමිෂන් සභාව(වයඹ)
නව පළාත් සභා ගොඩනැගිල්ල,
කුරුණෑගල.
2022.10.31

වයඹ පළාතේ සියලුම සමුපකාර සමිති,
සංගම් හා මණ්ඩල වල,
ගරු සභාපති/සාමාන්‍යාධිකාරී/කළමනාකරු.

## උසස් අධ්‍යාපන සුදුසුකම් සඳහා සමුපකාර සේවකයින් දිරිමත් කිරීම.

වයඹ පළාත් සමුපකාර සේවකයින්ට උසස් අධ්‍යාපන සුදුසුකම් ලබා ගැනීම දිරිමත් කිරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ අංක 2/2003 හි 02 ඡේදයේ විධිවිධාන පහත පරිදි සංශෝධනය කිරීමට අංක 2022.10.19 දිනැති කොමිෂන් සභාව නියෝගයක් නිකුත් කර ඇත. එම චක්‍රලේඛයේ අනෙකුත් ඡේදයන්හි ඇතුළත් විධිවිධාන එලෙසින්ම ක්‍රියාත්මක වේ.

02. " ඒ අනුව ඔබ සමිතියේ සිටින කිසියම් සේවකයකු සිය තනතුරේ රාජකාරියට අදාල කර ගත හැකි අන්දමේ උසස් අධ්‍යාපනයක් ලබා පශ්චාත් උපාධියක්, ගෞරව උපාධියක්, සාමාන්‍ය උපාධියක්, ඩිප්ලෝමාවක් හෝ වෙනත් පිළිගත හැකි වෘත්තීමය සහතිකයක් ලබා ඇත්නම් ඔහුට එක් වරක් පමණක් ගෙවනු ලබන දීමනාවක් හෝ / හා වැටුප් වර්ධකයක අගයට සමාන දීමනාවක් ලබා දීමට ක්‍රියා කළ හැකිය. මෙම දීමනාව හෝ වැටුප් වර්ධකය විශ්‍රාම වැටුප් කාර්යය සඳහා අදාළ කරගනු නොලැබේ."

02. දැනටමත් ඉහත විධිවිධාන යටතේ වැටුප් වර්ධක ගෙවීම අනුමත කර ඇති සේවකයින්ගේ එම වැටුප් වර්ධක මූලික වැටුපට එක් කර ඇත්නම්, එම වර්ධක අගය මූලික වැටුපෙන් ඉවත් කර ස.සේ.කො.චක්‍රලේඛ අංක 03/2020 හි 04 වෙනි උපවගන්තියේ දක්වා ඇති පරිදි මාසික දීමනාවක් ලෙස ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය.

03. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් ගේ එකඟතාවය ඇතිව බව ද දැනුම් දෙමි.

කොමිෂන් සභා නියමය පරිදි,

එච්.එම්.පී.කේ. හේරත්
ලේකම්
සමුපකාර සේවක කොමිෂන් සභාව(වයඹ).

**පිටපත්:**

01.ප්‍රධාන ලේකම් - වයඹ පළාත. - කා.දැ.පි.
02.ලේකම්,සමුපකාර සංවර්ධන වෙළඳ,ඉඩම්,විදුලිබල හා බලශක්ති,ක්‍රීඩා හා යෞවන කටයුතු - කා.දැ.පි.
සංස්කෘතික,කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය (වයඹ)
03.සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් (වයඹ පළාත) - දැ.ගැ.පි. හා අ.ක.ස.
04.සියලුම සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරු - දැ.ගැ.පි. හා අ.ක.ස.
05.සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් - කුරුණෑගල/හලාවත/කුලියාපිටිය/මහව - දැ.ගැ.පි. හා අ.ක.ස.